25-04-2026 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්

**සාරය:** සුමිහිරි දරුවනි, දරුවන් වන ඔබ වෙනුවෙන් නව රාජධානියක් නිර්මාණය කිරීම සඳහා ඉතාමත් දුර ඈත දේශයේ සිට පියා පැමිණ සිටිනවා. ඔබ දෙව්ලොව සඳහා සුදුසු අයෙක් බවට පත් වෙනවා.

**ප්‍රශ්නය:** ශිව බාබා කෙරෙහි නොකැඩෙන විශ්වාසයක් ඇති දරුවන්ගේ ලක්ෂණය කුමක්ද?

**පිළිතුර:** කුමන ආකාරයක උපදේශයක් ලැබුණත් ඔවුන් බාබාගේ ශ්‍රීමත් සියල්ල ඇස් වහගෙන, කිසිම පැකිලීමකින් තොරව පිළිපදිනු ඇත. පියා කෙරෙහි විශ්වාසය ඇති දරුවන් ගැන පියා වගකීම ගෙන තිබෙන බව දන්නා නිසා කිසියම් දෙයකින් වරදක් සිදු වෙයිද යන ගැටළුවක් ඔවුන්ට කවදාකවත් ඇති වන්නේ නැහැ. එම විශ්වාසයේ බලය ඔවුන් ලබන අතර ඔවුන්ගේ තත්ත්වය නොසැලෙන සහ නොසෙල්වෙන බවට පත්වනු ඇත.

**ගීතය:** මවත් පියාත් ඔබමයි...

ඕම් ශාන්ති. ඔබ දැන් ඇසුවේ කාගේ ප්‍රශංසාව ද? දරුවන් වන ඔබ හැර ලෝකයේ සිටිනා වෙන කිසිම කෙනෙක් නොදන්නා කෙනා ගැනයි. මෙය ඉහළම ඉහළ පියාගේ ප්‍රශංසාවයි. වෙන කිසිම කෙනෙකුගේ ප්‍රශංසාවකින් කිසිම ප්‍රයෝජනයක් නැහැ. ඉහළම ඉහළ කෙනා කියා සිටින්නේ එකම එක කෙනයි. කොහොමනමුත්, පියාගේ හැඳින්වීම ඔබට ලබා දෙන්නේ වෙන කවුද? ඔහු පැමිණ ජීවය හා තමා පිළිබඳ වූ හැඳින්වීම ඔබට ලබාදෙනවා. මහාත්ම ජීවයන් හා ආදර්ශමත් ජීවයන් ගැන කතා කළත් කිසිම මනුෂ්‍යයෙකුට ජීවාත්ම පිළිබඳ කිසිම දැනීමක් නැහැ. ශරීරය අතහැර දැමූ විට ජීවාත්මය එය අත හැර යනවා. ශරීරය මළ මිනියක් වෙනවා. ජීවාත්මය අවිනාශියි එය කවදාවත් මිය යන්නේ නැහැ. ජීවාත්මය තාරුකාවක් වගෙයි, අතිශය සූක්ෂමයි. මේ ඇස්වලින් ජීවාත්මය දකින්න බැහැ. සියල්ල කරන්නේ ජීවාත්මයයි. කොහොමනමුත්, ඔබ නැවත නැවතත් ශරීර අවධානයට පත්වන බැවින්, 'මම අහවලායි' හෝ 'මේක මමයි කරන්නේ' කියා කියනවා. ඇත්තෙන්ම සියල්ල කරන්නේ ජීවාත්මයයි. ශරීරය ඉන්ද්‍රියන් පමණයි. ජීවාත්මය අතිශයින්ම සියුම් බවත්, නළල මධ්‍යයේ රැඳී සිටිනා බවත් සන්‍යාසින් ආදී අය පවා සඳහන් කරනවා. කොහොමනමුත්, චරිතයක් රඟපෑමේ සංස්කාරය ජීවාත්මයකට තිබෙනවා යන දැනුම ඔවුන්ට නැහැ. කරන ක්‍රියාවල ප්‍රතිඵලයෙන් ජීවාත්මය නිදහස්වන නිසා ජීවාත්මයට සංස්කාර නැතැයි ඇතැම් අය කියනවා. සංස්කාර වලට අනුව ජීවාත්මය උපතක් ලබන බවත්, ඇතැම් අය කියනවා. එකිනෙක ගැටෙන අදහස් රාශියක් තිබෙනවා! කුමන ජීවාත්මද උපත් 84ක් ගන්නේ යන්න කිසිම කෙනෙක් දන්නේ නැහැ. සූර්ය වංශයට අයත් ජීවාත්මයන් පමණක් උපත් 84හි චක්‍රය වටා යන බව ඔබ දන්නවා. උපත් 84හි චක්‍රය වටා ගොස් පසුව අපිරිසිදුතාවයට පත්වන්නේ ජීවාත්මයයි. දැන්, ජීවාත්ම පාරිශුද්ධත්වයට පත් කළ හැක්කේ කාටද? එකම එක ඉහළම ඉහළ පරමාත්ම පියා පමණයි පාරිශුද්ධකරු වන්නේ. ඔහුගේ ප්‍රශංසාව සියල්ලටම වඩා උසස්ය. හැම කෙනාම උපත් 84ම ගන්නේ නැත. ප්‍රමාද වී එන අයට උපත් 84ක් ගත නොහැකියි. සියලු දෙනාම එකට පහළට එන්නේත් නැහැ. ස්වර්ණම යුගයේ ආරම්භයේ පැමිණෙන, සූර්ය වංශයේ රජවරුන් සහ පුරවැසියන් උපත් 84ම ගන්නවා. මනුෂ්‍යයින්ගේ සංඛ්‍යාව පසුව ටිකෙන් ටික වර්ධනය වෙනවා. ඇතැම් අය උපත් 83ක් ගන්නා අතර තවත් සමහරෙක් උපත් 80ක් ගන්නවා. සත් යුගයේදි සම්පූර්ණ ආයු කාලය වන අවුරුදු 150ම ගත කරනවා කිසිම කෙනෙක් අකාලයේ මිය යන්නේ නැහැ. මේ සියල්ලම පැහැදිලි කර කියා දෙන්නේ පරම පියා පමණයි. දැනට කිසිම කෙනෙක් උත්තරීතර ජීවය වන උත්තරීතර පියාව හඳුනන්නේ නැහැ. පියා කියනවා ඔබලා ජීවාත්මයන් වනවා සේම මම ද ජීවාත්මයක්මී. එකම වෙනස තිබෙන්නේ ඉපදීම සහ මරණය යන චක්‍රයට ඔබ ඇතුලත් වන නමුත් මම එයට ඇතුලත් නොවීමයි. ඔබ අපිරිසිදු වූ විටයි මා සිහිපත් කරන්නේ. බොහෝ දුක අත්විඳිනා විටයි ඔබ මාව සිහිපත් කරන්නේ. දරුවන් වන ඔබට ශිව බාබා උගන්වන්නේ මේ කාලයේදි පමණයි. ඇතැම් අය විමසනවා උත්තරීතර ජීවාත්මය පැමිණෙනවා කියා අපි විශ්වාස කරන්නේ කෙසේද? එමනිසා, ඒ අයට පැහැදිලි කර කියා දෙන්න සියලු දෙනාම, ඕ පාරිශුද්ධකරුවාණනි පැමිණෙන්න! කියා කෑ ගසනවා. ඔහු අශාරීරිකයි. ඔහුට තමාගේම කියා ශරීරයක් නැහැ. ඔහු අපිරිසිදු ලෝකයට ඇතුල් විය යුතුයි. ඔහු පිරිසිදු ලෝකයට එන එකක් නැහැ. මේ ආකාරයෙන් ඔවුන්ට පැහැදිලි කර කියා දෙන්න. උත්තරීතර ජීවාත්මය අනික් ජීවාත්ම සේම කුඩා බවත්, නමුත් මානව ලෝක වෘක්ෂයේ බීජය වන්නේ ඔහු බවත්,

දැනුමෙන් පිරුණුම කෙනා ඔහු බවත් පැහැදිලි කර කියා දෙන්න. පියා කියනවා ඔබ උත්තරිතර පියා, උත්තරිතර ජීවය කියා මට කතා කළා. ඔබ මට අඬගැසූ නිසා මා අනිවාර්යයෙන්ම පැමිණෙනවා. දුර ඈත දේශයේ සිටින්නා මෙම විදේශයට පැමිණ සිටිනවා කියාත් ගායනා කර තිබෙනවා. ඔබ විදේශයට එනම්, රාවන්ගේ දේශයට පැමිණියේ කෙසේද යන්න ගැන ඔබ දැන් පියාගෙන් දැන ගන්නවා. ස්වර්ණමය යුගයේදී හා රිදී යුගයේදී අප සිටින්නේ සත්‍යයේ දේශයේයි, එනම්, අපේම වූ දේශයේයි. පසුව තඹ යුගයත් සමඟම අපි විදේශයකට සහ විදේශී රාජ්‍යයකට ඇතුල් වෙනවා අපි පාප මාර්ගයට වැටෙනවා. එවිට භක්තිය ආරම්භ වෙනවා. පළමුවෙන්ම අපි ශිව බාබාව වන්දනා කරන්න පටන් ගන්නවා. මිනිස්සු ඉතාමත් ලොකු ශිව ප්‍රතිමා වැනි දේ සෑදුවත් ඔහු එතරම් විශාල නැහැ. ජීවාත්මයක් හා උත්තරිතර ජීවාත්මය අතර වෙනස ඔබ දැන් තේරුම් ගෙන තිබෙනවා. ඔහු දැනුමෙන් පිරුණු කෙනායි, නිරන්තරවම පාරිශුද්ධත්වයෙන් යුතු කෙනායි, සතුටු සාගරය හා ප්‍රමෝදයේ සාගරයයි. මෙය උත්තරිතර ජීවයේ ප්‍රශංසාවයි. මිනිස්සු කෑ ගසා කියනවා ඕ පාරිශුද්ධකරුවාණනි, පැමිණෙන්න! සෑම කල්පයකදීම පැමිණෙන උත්තරීතර ජීවය ඔහුයි. මිනිස්සු ඒ ඈත දුර දේශයේ සංචාරකයාට අඬගසමින් ඔහුගේ ගුණ ගායනා කරනවා. ඔවුන් බ්‍රහ්මාට හෝ සරස්වතීට කතා කරන්නේ නැහැ. ඔවුන් අශාරීරික උත්තරිතර ජීවාත්මයට කතා කරනවා. දුර ඈත දේශයේ වාසය කරන්නාණනි! කියා මිනිස්සු කෑ ගසා කතා කරනවා. සියලු දෙනාම අපිරිසිඳු වී ඇති නිසා දැන් මෙම විදේශයට පැමිණෙන්න. රාවන්ගේ රාජ්‍යය අවසන් වීමට ඇති කාලයේදී පමණයි මම පැමිණෙන්නේ. මම සංගම යුගයේදී පැමිණෙනවා. කිසිම කෙනෙක් මෙය දන්නේ නැහැ. ඉතාමත් කුඩා තිතක් වන ඔහු උත්තරිතර ජීවාත්මය බව කියා තිබෙනවා. ජීවය උත්තරිතර ජීවය බවත්, උත්තරිතර ජීවය ජීවයක් බවත් මිනිසුන් මේ දිනවල පවසනවා. ජීවාත්මයකට උත්තරිතර ජීවාත්මය විය නොහැකියි. සෑම ජීවාත්මයකගේම ස්වරූපය එකම වුවත් ජීවාත්මය හා උත්තරිතර ජීවාත්මය වෙනස් දෙකක්. ජීවාත්ම අපිරිසිඳු වෙනවා. ඔවුන්, ඔවුන්ගේ උපත් 84හි චරිත කොටස් රඟ පෑ යුතුයි. උත්තරිතර ජීවාත්මය නැවත උපත් ගන්නේ නැහැ. ඔවුන් පවසන ආකාරයට ජීවාත්මයක් උත්තරිතර ජීවාත්මය වෙනවානම්, එහි තේරුම සතෝප්‍රධාන් උත්තරිතර ජීවාත්මයත් තමෝප්‍රධාන් වෙනවා යන්නද? නැහැ! එය සිදුවිය නොහැක්කක්. පියා කියනවා මම සියලුම ජීවයන්ට සේවය කිරීමට පැමිණෙනවා. ඔවුන්ට මගේ උපතක් ගැන කතා කරන්න බැහැ. අපායේ වැසියන්ව දෙව්ලොව වැසියන් බවට වෙනස් කිරිමට මා පැමිණෙනවා. තම දෙව්ලොව ස්ථාපනය කිරිමට ඔහු විදේශයට පැමිණ සිටිනවා. පරමාත්ම පියා පමණයි පැමිණ අපව දෙව්ලොව සඳහා සුදුසු අය බවට පත් කරවන්නේ. අනෙක් සියලුම ජීවාත්මයන්ට රඟපෑම සඳහා තමාගේම චරිත කොටස් හිමිව තිබෙනා බව ද පැහැදිලි කර කියා දී තිබෙනවා. උත්තරිතර ජීවාත්මය ඉපදීම හා මරණයට එපිටින් සිටිනවා. ඔහු අනිවාර්යයෙන්ම පැමිණෙනවා. ඔහුගේ පැමිණීම සමරා ශිව රාත්‍රි උත්සව ගන්නේ අන්න ඒ නිසයි. කොහොමනමුත්, ඔහු පැමිණෙන්නේ කවදාද යන්න කිසිම කෙනෙක් දන්නේ නැහැ ඔවුන් ඒ ආකාරයෙන් ශිවාගේ උපත් දිනය සමරමින් සිටියා. ඔහු අනිවාර්යයෙන්ම දෙව්ලොව ස්ථාපනය කිරිමට සංගම් යුගයේදී පැමිණිය යුතුමයි. අපිරිසිඳු අය පාරිශුද්ධ කිරීමට සංගම් යුගයේදී ඔහු අනිවාර්යයෙන්ම පැමිණිය යුතුයි. පාරිශුද්ධ ලෝකය දෙව්ලොවයි. ඔවුන් කියනවා ඕ පාරිශුද්ධකරුවාණනි, පැමිණෙන්න! එමනිසා, ඔහු එම පාරිශුද්ධ වූ ලෝකය ස්ථාපනය කළේ පැරණි ලොව විනාශ වන අවධියේ වන්නට ඇති. ඔහු සෑම යුගයෙහිම පැමිණෙන්නේ නැහැ. පියා කියනවා අපිරිසිඳු ලෝකය පාරිශුද්ධ කරවීම සඳහා සංගම් යුගයේදී මා පැමිණිය යුතුයි. මෙය විදේශයයි එම රාවන්ගේ දේශයයි. කොහොමනමුත්, මෙය ඉදිරියටම ක්‍රියාත්මක වන රාවන්ගේ රාජ්‍යය කියා කිසිම කෙනෙක් තේරුම් ගන්නේ නැහැ. රාවන්ගේ මෙම රාජ්‍යය ආරම්භ වුණේ කවදාද යන්න ඔවුන් දන්නේ නැහැ. පළමුවෙන්ම ප්‍රධානම දෙය වන ජීවාත්මයන්ගේ සහ උත්තරිතර ජීවාත්මයෙහි රහස ගැන කියා දෙන්න. පසුව, සියලු දෙනාම පාරිශුද්ධත්වයට පත්කරවීම සඳහා සෑම කල්පයකදීම සංගම් යුගයේදී ඔහු පැමිණෙන බව පැහැදිලිකර කියා දෙන්න. මෙය ඔහුගේ කාර්යය මිසක ශ්‍රී ක්‍රිෂ්ණාගේ කාර්යය නොවෙයි. ශ්‍රී ක්‍රිෂ්ණා ඔහුගේම උපත් 84 ගනිමින් පහළට පැමිණෙයි. සූර්ය වංශයට අයත් සියලු දෙනාම පහළට පැමිණෙනවා. ගසක් භාගයක් අලුත් ලෙසිනුත්, භාගයක් පරණ ලෙසිනුත් නොතිබේවි. සෑම දෙයකම පරිහාණි කාලයක් තිබෙනවා. චක්‍රයේ කාල පරාසය ගැනවත් මිනිස්සු දන්නේ නැහැ. ග්‍රන්ථවල ඔවුන් ඒවාට දීර්ඝ කාලයක් දී තිබෙනවා. මේ සියල්ලම මෙහි සිට පැහැදිලි කර කියා දෙන්නේ පියාම පමණයි. ඒ ගැන තව ප්‍රශ්න තියෙන්න බැහැ. නිර්මාණකරු වන පියා කතා කරන්නේ සත්‍යයම පමණයි. අප බ්‍රහ්ම කුමාරයින් හා කුමාරීන් රාශියක් සිටිනවා. අපි සියලු දෙනාම මෙය විශ්වාස කරනා නිසා සහ ඔහුගේ පැවැත්මක් තිබෙන නිසා බොහෝ දෙනෙක් ඔහුව විශ්වාස කරනවා. තවත් ඉදිරියට යද්දී, ඔබ හට ශ්‍රද්ධා විශ්වාසය ඇති විට, ඔබට සියලු දේම තේරුම් ගත හැකි වේවි. පළමුවෙන්ම අශාරීරික උත්තරිතර පියා, උත්තරිතර ජීවය දුර ඈත දේශයේ සිට පැමිණ ඇති බව පැහැදිලි කර කියා දෙන්න.

කොහොමනමුත්, ඔහු ඇතුළු වන්නේ කුමන ශරීරයටද? සූක්ෂම කලාපයෙහි පැමිණීමෙන් ඔහුට කළ හැක්කේ කුමක්ද? ඔහු අනිවාර්යෙන්ම මෙහි පැමිණිය යුතුයි. ප්‍රජාපිතා බ්‍රහ්මා ද අවශ්‍යවන්නේ මෙහිදීයි. පියා මෙහි සිට බ්‍රහ්මා යනු කවුද යන්නත් ඔබට කියා දෙනවා. මම ඇතුල්වෙන කෙනා තමන්ගේ උපත් ගැන කිසිම දෙයක් දැන සිටියේ නැහැ, දරුවන් වන ඔබ දැන සිටියේත් නැහැ. මම ඔබව හදා ගැනීමට ගත් විට දරුවන් බවට පත් වෙනවා. මොහුත් ඇතුළුව දරුවන් වන ඔබගෙන් මා අසනවා ඔබගේම උපත් ඔබට අමතක වූවාද? ලෝක චක්‍රය දැන් අවසානය කරා පැමිණ තිබෙනා අතර, පසුව එය නැවතත් ඒ ආකාරයෙන්ම ගමන් කරාවි. ඔබව පාරිශුද්ධ කිරීමට සහ රාජයෝගා ඉගැන්වීමට මම පැමිණ සිටිමි. පාරිශුද්ධ වීමට වෙනත් ක්‍රමයක් නැත. මිනිසුන් මෙම රහස තේරුම් ගත හොත් ගංගා වලින් ස්නානය කිරීමට හෝ මේලාවන් ආදියට නොයනු ඇත. මිනිසුන් සෑමදාම ගංගා ජලයෙහි නා තිබෙනවා. තඹ යුගයේ සිටම ඔවුන් එය කරමින් ආවා. ගංගා වලින් නෑ විට ඔවුන්ගේ පව් සේදී යතැයි ඔවුන් විශ්වාස කරනවා. කොහොමනමුත්, ඔවුන්ගේ කිසිම පාපයක් දුරුවෙලා නැහැ. පළමුවෙන්ම ජීවාත්මයන් හා උත්තරීතර ජීවාත්මය ගැන වූ රහස ඔවුන්ට කියා දෙන්න. උත්තරීතර ජීවාත්මය වන පියාට ජීවයන් කෑ ගසා කතා කරනවා. ඔහු අශාරීරිකයි. ජීවාත්මයන් ද අශාරීරිකයි. ජීවාත්ම ඔවුන්ගේ ඉන්ද්‍රියන් හරහා කතා කරනවා. භක්තියට පසුව පරමාත්ම දෙවියන් පැමිණිය යුතුයි. මෙයත් නාටකයේ කොටසක්. පියා කියනවා නව ලොව ස්ථාපනය කිරීම සඳහා මා පැමිණිය යුතුය. දෙවියන්ට සිතිවිල්ලක් පහළ වුනා කියා ග්‍රන්ථවල සඳහන් කර තිබෙනවා. එමනිසා, නාටක සැළසුමට අනුකූලව ඔහුට අනිවාර්යෙන්ම එම සිතිවිල්ල තිබෙන්න ඇති. මීට පෙර ඔබ මේවා තේරුම් ගත්තේ නැහැ. දවසින් දවස නොකඩවා ඔබ තව තවත් මේවා තේරුම් ගන්නවා. පියා කියනවා මම ඔබට අළුත්ම සහ ගැඹුරුම දේ කියා දෙනවා. ඔබ ඒවාට සවන් දෙන අතර ඒවා අවබෝධයටත් ගනීවි. මීට පෙර ශිව බාබා තමාට උගන්වනවා කියා ඔබ කීවේ නැහැ. ඔබ දැන් මෙය ඉතාමත් පහසුවෙන් තේරුම් ගන්නවා. තේරුම් ගැනීමට තව බොහෝ දේවල් තිබෙනවා. අන් අයට කියා දෙන්නේ කෙසේද යන්න ඔහු දිගින් දිගටම ඔබට කියා දෙනවා. තමාට මේවා පැහැදිලි කර කියා දෙන්නේ අසීමිත පියා වන බැවින්, ඔහු අනිවාර්යෙන්ම කියන්නේ සත්‍යය වන බව පළමුවෙන්ම ඔවුන් විශ්වාස කළ යුතුයි. මේ සම්බන්ධයෙන් පටලැවෙන්න කිසිම දෙයක් නැහැ. ඇතැම් දරුවන් ශක්තිමත් වන අතර අනිත් අය දුර්වලයි. දුර්වල කෙනෙක්ට බැහැ තවත් කෙනෙක්ට කියා දෙන්න. පාසලකත් එය අංක පිළිවෙලටයි. බොහෝ දෙනාට උත්තරීතර පියා පැමිණ උගන් වන බව විශ්වාස කරන්නේ කෙසේද යන සැකය හා ප්‍රශ්නය ඔවුන් තුළ තිබෙනවා. මන්ද, දැනුම කියා දුන්නේ ශ්‍රී ක්‍රිෂ්ණා යැයි ඔවුන්ගේ බුද්ධීන් විශ්වාස කරන නිසා. කොහොමනමුත් ක්‍රිෂ්ණාට බැහැ අපිරිසිඳු ලෝකයට ඇතුල්වන්න. අපිරිසිඳු ලෝකයේ අපිරිසිඳු ශරීරයකට පැමිණිය යුත්තේ උත්තරීතර ජීවාත්මය පමණක් වන බව ඔවුන්ට ඔප්පු කර පෙන්වන්න. සෑම කෙනෙකුගේම බුද්ධිය එකිනෙකට වෙනස් බව පියා දන්නවා. ඇතැම් අයට ඉතාමත් ඉක්මනින් තේරුම් ගත හැකියි. හැකි අයුරින් පැහැදිලි කර කියා දෙන්න. සෑම බ්‍රාහ්මින් කෙනෙක්ම එක සමාන නැහැ, නමුත් සමහර දරුවන් තුළ ලොකු ශරීර අවධානයක් තිබෙනවා. සෑම කෙනාම අංක පිළිවෙලට බව මේ බාබාත් දන්නවා. ඔය දරුවන් උපදෙස් අනුගමනය කළ යුතුයි. ජොෂ්ඨ බාබා කියන දේ ඔබ පිළිගත යුතුයි. ගුරුන් විසින් කියන ලද දේ සියල්ල ඔබ පිළිපදිමින් සිටියා. ඔබව සත් යුගය වෙත ගෙන යන පියා කියන දේ දැන් ඔබ ඇස් වසාගෙන පිළපැදිය යුතුයි. කොහොමනමුත්, දරුවන්ට ඔවුන්ගේ බුද්ධීන් තුළ එවන් විශ්වාසයක් නැහැ. එහිදී ලාභයක් හෝ පාඩුවක් එහි වුවත් ඔබ එය පිළිගත යුතුයි. කිසියම් දෙයකින් ලැබෙන්නේ අලාභයක් යැයි ඔබට සිතුනත් බාබා කියනා නිසා සෑම විටම එය ශිව බාබාගෙන් පැමිණෙන දෙයක් වශයෙන් සලකන්න. ඔබට මේ කතා කරන්නේ බ්‍රහ්මා කියා සිතන්න එපා. ශිව බාබා සියල්ලට වග කියනවා. මෙය ඔහුගේ රථයයි, එමනිසා, ඔහු සියල්ල නිවැරදි කරනවා ඇත. ඔහු කියනවා මම මෙහි ඉන්නවා. සියල්ල කියන්නේ ශිව බාබා බව සලකන්න මෙයා කිසිම දෙයක් දන්නේ නැහැ. නිතරම මේ ලෙස සිතන්න. මෙම ශ්‍රද්ධා විශ්වාසය තිබිය යුතුයි. ශිව බාබා කියනවා නොකඩවා මට ඇහුම්කන් දෙන්න, එවිට ඔබට නොකඩවා යහපත සැලසේවි. මේ බ්‍රහ්මා යම් දෙයක් කිව්වත් ඒවාට වග කියන්නේ මමයි. දරුවන් වන ඔබ ඒ ගැන කරදර වෙන්න අවශ්‍යය නැහැ. ශිව බාබා සිහි කිරීමෙන් ඔබගේ තත්ත්වය තවත් ශක්තිමත් වේවි. මෙම විශ්වාසයෙන් වුනත් ඔබගේ පාප විනාශ වී ඔබ බලවත් වනු ඇත. වැඩි වැඩියෙන් පියා සිහිපත් කළ තරමට වැඩි වැඩියෙන් ඔබට බලය ලැබේවි. ශ්‍රීමත් අනුගමනය කර සේවය කරනා අය උසස් තත්ත්වයක් ලබා ගන්නවා ඇත. බොහෝ දෙනෙකුට ලොකු ශරීර අවධානයක් තිබෙනවා. බලන්න බාබා සියලුම දරුවන් සමඟ හරිම ආදරයෙන් ඉන්නා ආකාරය. ඔහු දිගින් දිගටම සියලු දෙනාටම කතා කරනවා. ඔහු දරුවන්ගෙන් විමසනවා ඔබ සුවසේ ඉන්නවාද? කිසිම අපහසුවක් නැහැ නේද? දරුවන් වෙනුවෙන් ඔහු තුළ එම සෙනෙහස තිබෙනවා. අසීමිත පියා දරුවන්ට ඉතාමත් ආදරෙයි! ශ්‍රීමත් වලට අනුකූලව ඔබ සේවය කළ තරමට ඒ තරම් ප්‍රමාණයක

සෙනෙහස ලබනු ඇත. යහපතක් ඇත්තේ සේවයේ පමණයි. ඇට මිදුළු පවා සේවය වෙනුවෙන් කැප කරන්න. දරුවන් නිතරම සේවය කරනා විට ඔවුන් හදවතේම අසුන් ගන්නා අතර, පළවෙනි ගණයේ දරුවන් කියා හඳුන්වනවා. කොහොමනමුත්, ඉදිරියට යන අතරේ ඕනෑම කෙනෙක් වෙත අපල බලපානු ඇත මායාගෙන් එදිරිවාදිකම් එල්ල වනු ඇත. ඒ අපල නිසා ඔවුන්ට දැනුම ලබා ගන්න බැහැ. ඇතැම් අය කිසිම වෙහෙසක් නොබලා භෞතික සේවය කරනවා. ඔබගේ රාජකාරිය සෑම කෙනෙක්ම සතුටේ දේශයේ පාලකයෙක් කරවීමයි. කිසිම කෙනෙකුට දුකක් දෙන්න එපා. ඇතැම් අයට දැනුමක් නොමැති වූ විට ඔවුන් නොයෙකුත් දුක් කරදර ඇති කරනවා. පසුව ඔබ ඔවුන්ට කොපමණ පැහැදිලි කළත් ඔවුන්ට කිසිවක් තේරුම් ගත නොහැකි වනවා. පළමුවෙන්ම ජීවාත්මයන් ගැනත් උත්තරීතර ජීවාත්මය ගැනත් සහ ජීවාත්මයන් තුළ උපත් 84ක අවිනාශී චරිත කොටස් පටිගත වී ඇත්තේ කෙසේද යන්නත් පැහැදිලි කර කියා දෙන්න. එය කවදාකවත් වෙනස් වන එකක් නැහැ. මෙය නාටකයේ තීරණය වී හමාරයි. මෙම විශ්වාසය ඇති අය කවදාවත් සෙලවෙන්නේ නැහැ. බොහෝ අය චංචල වෙනවා. අවසානයේදී පිදුරු ගොඩට ගිනි තැබූ පසු ඔබ නොසෙල් වී සිටිනු ඇත. දැන් ඔබ බොහෝ උපායශීලීව පැහැදිලි කළ යුතුයි. ඉතාමත් හොඳ දරුවන් සේවයේ කාර්ය බහුලව ඉන්නවා. ඔවුන් හදවතේම අසුන්ගෙන සිටිනවා. බොහෝ දෙනා ඉතාමත් වේගයෙන් ඉදිරියට යනවා ඔවුන් හොඳ උත්සාහයක් දරණවා. සේවය සඳහා ඔවුන් තුළ ලොකු කැමැත්තක් තිබෙනවා. ඔබ ළඟ ඇති ගුණ ධර්ම ගැන බාබා පවසනවා. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. සේවය සඳහා ඔබේ ඇට මිදුළු පවා ප්‍රදානය කරන්න. කිසිම දෙයක් ගැන සැක තබා ගන්න එපා. සේවය කිරීමෙන් සෑම කෙනෙකුටම සතුට ලබා දෙන්න. දුක නොවෙයි.
2. ශ්‍රද්ධා විශ්වාසයේ බලයෙන් ඔබගේ තත්ත්වය නිශ්චලව තබා ගන්න. පියා සියල්ලටම වග කියන නිසා ඔබ ලබනා සෑම ශ්‍රීමත් එකකම යහපත ගැබ් වී ඇත. එමනිසා, කරදර වෙන්න එපා!

**වරදානය:** ඔබගේ යෝග්‍යුක්ත ස්ථිතියෙන්, සියලු සූක්ෂම හෝ ශක්තිමත් බන්දන කපා දමා, බන්දන වලින් නිදහස් වේවා.

1) යෝග්‍යුක්ත වීමේ ලක්ෂණය වන්නේ බන්දන වලින් නිදහස් වීමයි. යෝග්‍යුක්ත වීමේදී, ශ්‍රේෂ්ඨතම, අවසන් බන්දනය වන්නේ, තමන් නුවණැති කෙනෙක් බව සහ ශ්‍රීමත් තමන්ගේම බුද්ධියේ ආශ්චර්යයක් බව සැලකීමයි. මෙය තම බුද්ධිය, ශ්‍රීමත් සමග මිශ්‍ර කිරීම වන අතර එය හැඳින්වෙන්නේ බුද්ධියේ අහංකාරකම ලෙසයි.

2) යමෙක් දූර්වලතාවයක් ගැන ඔබට සංඥාවක් ලබා දෙන විට හෝ යම් නරක දෙයක් ගැන ඔබට පවසන විට, ඔබට නිෂ්ඵල සිතිවිලි ඇති වන්නේ නම්, එයත් බන්දනයකි. ඔබ මෙම බන්දන කපා දමා, ජය, පරාජය, නින්දා, ප්‍රශංසා තුළදී සමානව සිටින්නේ නම්, එවිට ඔබ බන්දන වලින් සම්පූර්ණයෙන් නිදහස් බව කියයි.

**පාඨය:** ක්‍රියා කිරීමට පෙර, සෑම දෙයක් ගැනම සලකා බැලීම, දැනුමින් පිරිපුන් ජීවාත්මයකගේ ගුණයකි.

***** ඕම ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: ශ්‍රේෂ්ඨ වීම සඳහා මිහිරි බව සහ නිහතමානිකමේ ගුණධර්ම ධාරණය කරගන්න.**

නොදැනුවත් දරුවෙක් හානිදායක භාණ්ඩයක්, ක්‍රීඩා භාණ්ඩයක් බව සලකන විට, එය අත්හැරීමට

හැකි වන පරිදි ඔහුට වෙනත් දෙයක් ලබා දෙයි. ඒ ආකාරයෙන්ම, කෙනෙක් තාවකාලික ගෞරවය හෝ ගරු බුහුමන් වලට ආශා කරන විට හෝ යම් තාවකාලික ආශාවක් ඇති විට, ඔහුට එම ගෞරවය ලබා දී, ඔබ නිහතමානී වන්න. ඔබ ඒ වෙලාවේ එම කෙනාව නිවැරදි කිරීමට තැත් කළොත් ගැටුමක් ඇති වෙයි. එබැවින්

එවන් වෙලාවක යුක්තියුක්ත අන්දමකින් කටයුතු කර, දයාවන්ත වී, ගෞරවයෙන් සමාව දෙන්න. ප්‍රථමයෙන් මෙම දේ හානිදායක බව ඔහුට හැඟී යන සේ, ඔහුට වැටහීම ලබා දෙන්න.